# ඓතිහාසික හඟුරන්කෙත විෂ්ණු දේවාලයේ කලාත්මක අගය පිළිබඳ විමර්ශනයක්

ඒ.එම්.ඒ.පී.ඩබ්ලිව්.එස්. අතාවුද[1], ඒම්.වී.ඒ.පී මධුරංගි[2]

දෙ වැනි රාජසිංහ රජතුමා විසින් නිර්මාණය කරන ලද ඓතිහාසික හඟුරන්කෙත විෂ්ණු දේවාලය නුවරඑළිය දිස්ත්‍රිකයේ මහනුවර දිස්ත්‍රික් මායිමේ පිහිටා ඇත. ඓතිහාසිකත්වය හා කලාත්මක නිර්මාණ රැසකින් සමන්විත මෙම දේවාලය අද වන විට මානව ක්‍රියාකාරකම්වලින් විනාශ වී තිබෙන අතර ඒ පිළිබඳව විමසා බැලීමත්, කලා නිර්මාණ අධ්‍යයන කිරීම සඳහා ක්ෂේත්‍ර ගවේෂණය, ශාස්ත්‍රගවේෂකයන් ද විද්‍යාර්ථයන් ද දැනුවත් කිරිම මෙහි අරමුණ වේ. මේ සඳහා ක්ෂේත්‍ර තොරතුරු එක්රැස් කිරීම මෙහි අධ්‍යයන ක්‍රමවේදය ලෙස යොදා ගන්නා ලදි. මහනුවර යුගයට අයත් කලාත්මක නිර්මාණ සහිත මෙම දේවාලයේ මහදෙව්මැඳුර, දෙ වැනි විමලධර්මසූරිය සහ කීර්ති ශ්‍රී රාජසිංහ යන රජවරුන් විසින් ද ප්‍රතිසංස්කරණය කර තිබේ. 1818 උඩරට විමුක්ති අරගලයේදී මෙම විෂ්ණු දේවාලය සිංහල සේනාංකවලට මුහුණදීම සඳහා බලකොටු ලෙස ඉංග්‍රිසීන් උපයෝගි කරගෙන ඇත. දේවාලයට අයත් භූමිය කොටස් දෙකකින් යුතු අතර පළමුව බැතිමතුන් ඇතුළුවන කොටස සීමා පවුරුවලින් වටකර ඇත. මෙහි පත්තිරිප්පුවේ එක් පසෙක චාමර සලන්නෙකු නිරූපිත අල්පොන්තක කැටයමක් හා තවත් පසෙක ලී කෙළියෙහි යෙදෙන නැට්ටුවන් තිදෙනෙකු නිරූපිත අල්පොන්තක ගල් කැටයම් වේ. දෙ වැනි කොටස උස් මළුවක පිහිටා ඇති අතර මෙහි දිග්ගෙය, විෂ්ණු දේවාලය, අළුත්නුවර දේවතා බණ්ඩාර දේවාලය, මුළුතැන්ගෙය පිහිටා ඇත. දිග්ගෙය සිවුරැස් කුළුණු 28 කින් යුතු අතර බිත්ති සක්කාගල් හා මැටියෙන් සාදා හුණු කපරාරු කර ඇත. මෙහි පියගැට පෙළේ සරල මල් සැරසිලක් මෙන්ම සිංහ රූ කැටයම් කළ ගල් පුවරු දෙකකි. දිග්ගෙය හා විෂ්ණු දේවාලයෙහි පිළ අලංකාර ලෙස නළගනන් පෙළක් දක්වා තිබේ. දිග්ගෙය සිට දේවාලයට පිවිසෙන පියගැට පෙළ පාමුල කැටයම් කළ ත්‍රිකෝණාකාර සඳකඩපහණකි. මෙය ලියවැල්, පළාපෙති, ගල්බිංදු රටාවලින් යුතුය. මුළුතැන්ගෙය වාස්තුවිද්‍යාත්මක සැකිල්ලකින් නිර්මාණය නොකළ ද පෞරාණිකත්වය එලෙසම පවතී. විෂ්ණු දේවාල භූමියේ තිබෙන රාජසිංහ පැණි වරකා ගස ද හඟුරන්කෙත ඓතිහාසිකත්වය විදහා දක්වන ඉතා වැදගත් සාධකයකි. කලාත්මක බවින් අනූන වන මෙම දේවාලය බිත්ති හා ඇතැම් කැටයම් අද වන විට අවිචාරවත් ලෙස වර්ණාලේප කර තිබීමෙන් එහි පෞරාණිකත්වය නැති වී ගොස් ඇත. නවීකරණයට ලක්ව නැත්තේ දේවාල පියස්සේ ඇතැම් කොටස් හා ගෙබිම පමණකි. මේ අනුව හඟුරන්කෙත විෂ්ණු දේවාලයේ අදටත් පෞරාණිකත්වය රැකදෙන කලාත්මක අංගයන් මගින් එහි ඓතිහාසිකත්වය කොතෙක් ද යන්න පැහැදිලිය.

ප්‍රමුඛ පද : හඟුරන්කෙත, විෂ්ණු දේවාලය, දෙවන රාජසිංහ රජු, වාස්තුවිද්‍යාව

---

[1 2] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. shamaliathawuda@gmail.com